විෂය ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණ මාලාව - 2016 ( බාහිර විභාග)
සවිප්‍ර 1.1 - සමාජ විද්‍යාවේ මූලධර්ම
දේශක : ජ්‍යෙ. කථි.පී.කේ.එම්. දිසානායක
සමාජ විද්‍යා අධ්‍යයනාංශය
රුහුණ විශ්වවිද්‍යාලය

**හැඳින්වීම**

පුද්ගලයා පිළිබඳව සහ පුද්ගලයා හා සම්බන්ධ සමාජ ලෝකය වඩාත් හොඳින් තේරුම් ගැනීම උදෙසා උපකාරී වන විෂය ක්ෂේත්‍රය සමාජ විද්‍යාව (Sociology) නම් වේ. මෙම විෂය මඟින් පුද්ගල චර්යාව හැඩගැස්වීම කෙරෙහි බලපානු ලබන සමාජ කාරණා පිළිබඳව අධ්‍යයනය කිරීමට අවශ්‍ය හැකියාව සාධනය කරනු ලබයි. ඉතිහාසය පුරාවටම සමාජ දාර්ශනිකයන් (Social Philosophes) සහ ආගමික බලාධිකාරීන් (Religion Authorities) විසින් මිනිස් හැසිරීම් පිළිබඳ ගණනය කළ නොහැකි තරම් ප්‍රමාණයක නිරීක්ෂණ සිදුකොට ඇතත් මිනිස් චර්යාව පිළිබඳ වඩාත් ක්‍රමාණුකූල විග්‍රහයක් මුලින්ම අනාවරණය කරන ලද්දේ ප්ලේටෝ සහ ඇරිස්ටෝටල් වැනි ග්‍රීක දාර්ශනිකයන් විසින්ය. නමුත් මෙකී සමාජ චින්තනය, විද්‍යාත්මක චින්තනයේ විප්ලවීය විපර්යාසයන් සමඟ වේගයෙන් වෙනස් වන්නට විය.

**සමාජ විද්‍යාව විෂයයේ ආරම්භය හා විකාශනය**

සමාජ විද්‍යාව යන වචනය මුලින්ම භාවිතයට ගන්නා ලද්දේ ක්‍රි.ව. 1837 දී ප්‍රංශ ජාතික දාර්ශනිකයකු වූ Auguste Comte විසින්ය. ඒ නිසාම ඔහු සමාජ විද්‍යාවේ පියා (Father of Sociology) ලෙස සැලකේ. Plato, Aristotle සහ Confucius වැනි දාර්ශනිකයන්ගේ අධ්‍යයනික විනය ක්‍රම සමාජ විද්‍යාව නම් විෂයේ ආරම්භය කෙරෙහි කිසියම් බලපෑමක් සිදුකළත් මෙම විෂය අනන්‍යතාවය සහිත විෂයයක් බවට පත්වූයේ 19 වන සියවසේදී සිදු වූ නවීකරණය හේතුවෙන් ගොඩනැඟුණු සමාජ අභියෝගයන්ට මුහුණ දීමේ ක්‍රමවේදයක් වශයෙනි. නවීකරණයත් සමඟ සිදු වූ සමාජ විපර්යාසයන් හේතුවෙන් එතෙක් පැවති සමාජ සම්ප්‍රදායන් සහ ආගම්වල සිදු වූ වෙනස්කම් පුද්ගල චර්යාව සැලකිය යුතු මට්ටමේ විසන්විධානයන්ට ලක්වන්නට හේතු විය. මෙකී ව්‍යාකූල සමාජ වටපිටාව වඩාත් විද්‍යාත්මකව හැදෑරීමේ අවශ්‍යතාවය පෙරටු කරගෙන සමාජ විද්‍යාව නම් විෂයය වඩාත් විද්‍යාත්මක සහ ක්‍රමාණුකූල මුහුණුවරකින් 19 වන සියවසේදී බිහිවන්නට විය.

සමාජ විද්‍යාව විද්‍යාත්මක විෂයයක් වශයෙන් ආරම්භ වීම කෙරෙහි බලපෑ පසුබිම් සාධක අංග 03 ක් යටතේ හඳුනාගත හැකිය.

01. ආගමික ප්‍රතිසංස්කරණය (The reformation)
02. කාර්මික විප්ලවය (Industrial Revelolution, 1760-1830)
03. ප්‍රංශ විප්ලවය (French Revelution, 1789)

ඉහත සඳහන් සමාජ සන්සිද්ධීන් හේතුකොටගෙන යුරෝපීය සමාජයේ විවිධ සමාජ ප්‍රශ්න නිර්මාණය වූ අතර විසංවිධානය වූ සමාජය ප්‍රතිසංවිධානය කිරීමට අවශ්‍ය නව ක්‍රමවේද සකස් කිරීම චින්තකයන්ට අභියෝගයක් විය. ඒ අනුව සමාජ පිළිබඳව විද්‍යාත්මකව අධ්‍යයනය කිරීම සඳහා ඔවුන් විසින් හඳුන්වා දුන් නව විෂය සමාජවිද්‍යාව නම් වේ. මෙම විෂය ඔස්සේ සාකච්ඡාවට ලක්වන සංකල්ප සහ න්‍යායන් පිළිබඳ මෙම අත්පත්‍රිකාව යටතේ කෙටියෙන් විස්තර වේ.

**<u>සමාජානුයෝජනය (Socialization)</u>**

සමාජවිද්‍යාඥයින්, සමාජ මනෝවිද්‍යාඥයින්, මානවවිද්‍යාඥයින්, දේශපාලන විද්‍යාඥයින් සහ අධ්‍යාපනඥයින් විසින් ඉතා සුළභව භාවිත කරනු ලබන සංකල්පයක් වන සමාජානුයෝජනය යන්න, තනි පුද්ගලයන් තම සංස්කෘතිය ඉගෙන ගන්නා සමාජ ක්‍රියාවලියඩත්, කුඩා කල පටන් තම සමාජයේ ධර්මතා අනුව

ජීවත් වීමට ඉගෙන ගැනීමත් යන පුද්ගල ක්‍රියාකාරකම් හා සම්බන්ධ වෙයි. සමාජානුයෝජන ක්‍රියාවලිය තුළින් පුද්ගලයා සිය සමාජ ජීවිතය අවබෝධ කර ගැනීමටත් තම අනන්‍යතාව පිළිබඳව හැඟීමක් ලබා ගැනීමටත්, අනෙකුත් පුද්ගලයින් සමඟ නිවැරදිව අන්තර් ක්‍රියා කරන්නේ කෙසේද යන්න තේරුම් ගැනීමටත් ඉගෙන ගනී. සමාජාන්යෝජනය පුද්ගලයකුගේ ජීවිත කාලය පුරාවටම සිදුවන්නක් වන බැවින් එය ක්‍රියාවලියක් ( lifelong Process) ලෙස අර්ථ දැක්වේ. සමාජානුයෝජනය පුද්ගලයා සහ සමාජය අතර අත්‍යවශ්‍ය සම්බන්ධකය වෙයි. (කෙන්ඩෝල් - 2003) සමාජානුයෝජනයෙන් නිරන්තරවම අර්ථ නිරූපනය වන්නේ, පුද්ගලයා ක්‍රමයෙන් සමාජ භූමිකාවන් වෙත වර්ධනය වන සහ එම භූමිකාවලට ඇඳී ඇති අපේක්‍ෂාවන් සමඟ එකඟ වීමට ඉගෙන ගැනීමේ ක්‍රියාවලියක් ලෙසයි (ෆර්සෙත් - 2006).

**සමාජානුයෝජනය පිළිබඳ න්‍යායාත්මක පැහැදිළි කිරීම්**

බොහෝමයක් විද්‍යාත්මක පැහැදිළි කිරීම්වලට අනුව පුද්ගල හැසිරීම්, විශ්වාස සහ ළමා සහ වැඩිහිටි ක්‍රියාකාරකම් සකස් වීම කෙරෙහි සමාජානුයොජන ක්‍රියාවලිවය අත්‍යවශ්‍ය වූවක් වේ.

**Klause Hurrelmann**

මොහු විසින් රචිත *"Social Structure and Personality development"(1989/2009)* කෘතියට අනුව පුද්ගලයාගේ පෞරෂ සංවර්ධනය කෙරෙහි සමාජානුයෝජනය සෘජුවම බලපාන අතර එය පෙරලා සමාජ අභිවෘද්ධිය කෙරෙහි බලපෑනු ලබයි.

**Lawrence Kohlberg**

මොහු විසින් ඉදිරිපත් කරන ලද *Theory of Moral Development (1981)* මගින් පුද්ගලයා තමා ජීවත්වන සමාජය තේරුම් ගනිමින් සිය චරිතය සංවර්ධනය කර ගැනීම ජීවන අවධීන් අනුව වෙනස්වන බව සඳහන් කරයි.

1. Pre-conventional stage-පූර්ව ගතානුගතික අවධිය ( ළමයින් ලෝකය තේරුම් ගන්නේ වේදනාව සහ සතුට පදනම් කොට ගෙනය)
2. conventional stage- ගතානුගතික අවධිය (නව යොවුන් වියේ පසුවන්නන් හරි වැරැද්ද තේරුම් ගන්නේ දෙමාපියන්ගේ අභිලාශයන්ට අනුව සහ සංස්කෘතික සාරධර්මයන්ට කීකරු වීමක් වශයෙන් ආත්මාර්ථකාමීත්වය අඩුකිරීම හේතුවෙන්ය)
3. Post-conventional stage-පශ්චාත් ගතානුගතික අවධිය ( පුද්ගලයා සමාජයීය ධර්මතාවයන් අභිබවා ආචාරධර්මීය ප්‍රතිපත්තීන් මත පදනම්ව කටයුතු කරයි)

**Carol Gillingan**

මොහු විසින් ඉදිරිපත් කරන ලද "theory of gender and moral development"(1982) මගින් ගැහැනු සහ පිරිමි ළමයින්ගේ චරිතය සංවර්ධනය පිළිබඳ සැසඳීමක් කරයි. එහි දී අවස්ථාවන් විනිශ්චය කර ගැනීමේ දී සාපේක්ෂව පිරිමි ළමයාට වැඩි ස්වාධීනත්වයක් පවතී.

**Eric H. Erikson (1902-1994)**

මොහු විසින් පුද්ගලයාට ජීවී කාලය පුරාවට මුහුණ දීමට සිදුවන අභියෝග පිළිබඳ විස්තර කරයි.

1. ළදරු අවධිය- විශ්වාසය සහ සැකය ඉගෙන ගනී
2. බාල වධිය- සැකයට එරෙහි ස්වාධීනත්වය පිළිබඳ අභියෝගය සමග පොරබදී
3. පූර්ව පාසැල්විය- හරි වරුද්ද අතර වෙනස තේරුම් ගැනීමට උත්සාහ ගනී
4. පූර්ව යොවුන් විය- උද්යෝගය සහ දුර්වලකම ගැන ඉගෙන ගනී
5. යොවුන් විය-අනන්‍යතාවය ගොඩනගා ගැනීම පිළිබඳ අභියෝගය සමග පොර බදී
6. යොවුන් වැඩිහිටිවිය-සමීප ඇසුර සහ හුදකලාභාවය සමග කටයුතු කිරීම පිළිබඳ ජීවන දැක්ම ගොඩනගා ගනී
7. මැදි වැඩිහිටිවිය- ජීවිතය තුළ වෙනසක් ඇතිකර ගැනීමට උත්සාහ ගනී
8. වියපත් අවධිය-සම්පූර්ණත්වය සහ අපේක්ෂාවිරහිතභාවය පිළිබඳ අභියෝගය තවමත් ඉගෙන ගනී

**George Herbert Mead (1863-1931)**

ඔොහු විසින් social behaviorism theory යටතේ පුද්ගලයාගේ ආත්ම සංකල්පය සංවර්ධනය විම කෙරෙහි සමාජීය අත්දැකීම් ඉවහල්වන ආකාරය වස්තර කරයි. C.H cooly (1902-1983) විසින් ඉදිරිපත් කරන ලද looking glass self නම් යෙදුම මෙම කාරණය තවදුරටත් පැහැදිළි කරනු ලබයි.

**Judith R Harris (Birth-1938)**

මැය විසින් ඉදිරිපත් කරන ලද group socialization theory මගින් ළමයකුගේ වැඩිහිටි පෞරෂ සංවර්ධනය කෙරෙහි භාහිර පරිසරය සිදුකරන බලපෑම ප්‍රභල බව අවධාරණය කරයි. එහි දී දෙමාපියන් ඇතුලු පවුලේ සමීපතමයින්, පුද්ගල පෞරෂය හැඩගසීම් කෙරෙහි සිදු කරන බලපෑම සාපේක්ෂව අවම වූවක් බවට තර්ක කරයි.

<u>සමාජානුයෝජනයේ මූලික ප්‍රභේධ</u>

1. ප්‍රාථමික සමාජානුයෝජනය (Primary Socialization)
2. ද්විතියික සමාජානුයෝජනය (Secondary Socialization)

මෙම මූලික ප්‍රභේධයන් දෙකට අමතරව තවත් උප ප්‍රභේධ කිහිපයක්ම හදුනාගත හැකිය.

1. අපේක්ෂිත සමාජානුයෝජනය (Anticipatory socialization)
2. පුනර් සමාජානුයෝජනය (Re socialization)
3. සංවිධාන සමාජානුයෝජනය (Organizational socialization)
4. කණ්ඩායම් සමාජානුයෝජනය (Group socialization)
5. ස්ත්‍රී පරුෂ සමාජභාවීය සමාජානුයෝජනය (Gender socialization)
6. වාර්ගික සමාජානුයෝජනය ( Racial socialization)
7. සැළසුම්සහගත සමාජානුයෝජනය (Planned socialization)
8. ස්වභාවික සමාජානුයෝජනය (Natural socialization)
9. ධනාත්මක සමාජානුයෝජනය (Positive socialization)
10. ඍණාත්මක සමාජානුයෝජනය (Negative socialization)

<u>සමාජානුයෝජන කාරක</u>

1. ප්‍රාථමික සමාජානුයෝජන කාරක →
   - පවුල
   - දෙමාපියන්
   - සහෝදර සහෝදරියන්
   - ඥාතීන්
2. ද්විතික සමායානුයෝජන කාරක →
   - පාසල
   - සමවයස් කණ්ඩායම්
   - ස්වේච්ඡා සංවිධාන
   - සන්නිවේදන මාධ්‍යයන්

<u>සමාජානුයෝජනය සිදුවන ආකාරය</u>

මනෝවිද්‍යාත්මක න්‍යායන් යටතේ,

සිග්මන් ෆ්‍රොයිඩ් - මානව සංවර්ධන අවධීන් 03 ඉඩ්, ඊගෝ, සුපර් ඊගෝ

ජීන් පියාජේ - ළමා සංවර්ධන අවධීන් 04

i. ඉන්ද්‍රිය - චාලක අවධිය (අවු. 02 දක්වා)
ii. පූර්ව ක්‍රියාකාරී අවධිය (අවු. 02 - 05 තෙක්)
iii. සවිමත් ක්‍රියාකාරී අවධිය (අවු. 07 සිට 11 තෙක්)
iv. විධිමත් ක්‍රියාකාරී අවධිය (අවු. 12 සිට නව යොවුන් විය)

සමාජ විද්‍යාත්මක න්‍යායන් යටතේ,

චාල්ස් හෝ(ර්)ටාන් කුලි - දර්පන තල ආත්මය (The Looking glass self)

මෙය අදියර 03 ක ක්‍රියාවලියකි.

i. අනෙක් අයට අපගේ පෙනුම සහ පෞරුෂය පෙනෙන ආකාරය පිළිබඳව අප සිතයි.

ii. අනෙකුත් පුද්ගලයින් අපගේ පෙනුම සහ පෞරුෂය විනිශ්චය කරන ආකාරය ගැන අප සිතයි.
iii. ඒ අනුව අප විසින් අහංභාවී - සංකල්පයක් ගොඩනගා ගනු ලබයි.

මාග්‍රට් මීඩ් - කුලිගේ සංකල්පය තවදුරටත් විග්‍රහ කරමින් අහංභාවය "මම" සහ "මා" ලෙස බෙදා දක්වයි.

**ළමයින් සමාජානුයෝජනය වන ආකාරය**

මෙය මූලික ප්‍රභේධයන් දෙකක් යටතේ හදුනා ගත හැකිය

1. විධිමත් අධ්‍යාපනය (Formal education)
2. අවිධිමත් අධ්‍යාපනය (Informal education)

**සමාජානුයෝජනයේ වැදගත්කම**

1. පුද්ගලයා තමුන් ජීවත්වන සමාජයේ ප්‍රතිමාන අභ්‍යන්තරීකරණය කර ගැනීම
2. පුද්ගලයා සමාජයීය සත්වයකු බවට පත් කිරීම
3. පුද්ගල පෞරෂය ගොඩනැගීම සහ සංවර්ධනය (personality formation and development)
4. සමාජ ඒකීයත්වය ගොඩනැගීමට අවශ්‍ය අසිප්‍රේරණය ඇති වීම

**<u>සංස්කෘතිය CULTURE</u>**

Culture යන් පදය ලතින් භාෂාවෙහි වගාකිරිම යන වචනයට සමාන අර්ථයක් ඇති "කුල්ටූරා" යන පදයෙන් බිදී එන ලද්දකි. සංස්කෘතිය යන පදයට අරුත් රැසක් පවති. 1952 දි ALFFRED KROEBER සහ CLYDE CLUCKHOHN විසින් 1952 දී රචිත "CULTURE ; A CRITICAL REVIEW OF COMPONENTS AND DEFINITIONS" නම් කෘතියෙහි සංස්කෘතිය පිළිබඳ නිර්වචන 164 ක් පෙන්වා දී ඇත.

**<u>සංස්කෘතිය යනු කුමක්ද?</u>**

- මිනිසා සමාජයෙහි සාමාජිකයෙකු වශයෙන් උරුමකරගනු ලැබුවා වු දැනුම, විශ්වාස, කලාව, නීතිය, සදාචාරය, සිරිත් විරිත් හා අනෙකුත් හැකියාවන් ගෙන් හා පුරුදු වලින් සමන්විත වන්නා වූ සංකීර්න සමස්ථය යි. E.B. TYLOR – PRIMITIVE CULTURE, 1870

- සාමාජයක සාමජිකයින් විසින් ඉගෙනගත්තාවූ ද, පොදුවේ අන්‍යෝන්‍ය වශයෙන් උරුම කරගනු ලැබුවා වූ ද සහ පරම්පරාවකින් පරම්පරාවකට විකාශනය කරනු ලබන්නා වූ ද ජීවන ක්‍රමයයි.RALF LINTON – STUDY OF MAN, 1936

- සමාජයේ සාමාජිකයෙකු ලෙස මිනිසා විසින් උරුමකරගනු ලැබු විශ්වාස, කලාව සහ සියළුම ගති පුරුදු වලින් ද මිනිසා විසින් නිර්මාණය කරනු ලැබු සියළුම දේවල් වලින් ද යුක්ත වූ සංකීර්න සමස්ථය යි. KLUCKHOHN AND KELLY – THE CONCEPT OF CULTURE, 1870

**සංස්කෘතියක් තුල දැකිය හැකි මූලික ගුණාංග/ලක්‍ෂණ**

I. පොදුවේ පිළිගත් ජීවන ක්‍රමයකි
II. උගත් දෙයකි
III. ගතික වේ
IV. සාමාජිකයන්ගේ හැසිරීමට මග පෙන්වයි
V. සමාජයන් අතර වෙනස්කම් ඇතිකරයි

**සංස්කෘතියක් හැඩ ගැසීමට බලපාන සාධක**

1. භෞතික පිහිටීම :- අන් සමාජයන්ට විවෘතව හෝ ඈත්ව පිහිටීම
2. දේශගුණික තත්ත්වයන් :- දේශගුණික විපර්යාසයන්ට අනුකූල වීම
3. ඓතිහාසික සිදුවීම :- ආක්‍රමණ, සංක්‍රමණ
4. මුහුණ දෙනු ලබන අභියෝග :- යුධ කෝලහල, ස්වභාවික ආපදා

**සංස්කෘතියෙහි සංරචකයන්**

1. සංකේතයන් (SYMBOLS)
2. භාෂාව (LANGUAGE)
3. ඇගයුම් හා විශ්වාස (VALUES AND BELIEFS)
4. ප්‍රතිමාන (NORMS)
5. ධර්මතා හා ජනවහර (MORES AND FOLKWAYS)

**සංස්කෘතික ප්‍රභේදයන්**

- පරමාදර්ශී සහ සැබෑ සංස්කෘතිය :- Ideal and Real Culture
- භෞතික හා අභෞතික සංස්කෘතිය :- Material and Non – Material Culture
- උප සංස්කෘතිය :- Sub Culture
- සංස්කෘතික කල්පමාව :- Cultural Lag
- මානව කේන්ද්‍රණය :- Sub Culture
- සංස්කෘතික සාපේක්ෂතාවය :- Cultural Relativism
- සංස්කෘතික විවිධත්වය :- Cultural Diversity

**සංස්කෘතිය හා සමාජය අතර පවතින සම්බන්ධතාවය:**

**අ. දැනුම, විශ්වාස, කලාව, සදාචාරය ආදී සමාජ උරුමයන් මගින් සංස්කෘතියක් ගොඩනැගේ.**
**ආ. සංස්කෘතිය සමාජීය නිර්මාණයකි.**
**ඇ. ජීව විද්‍යාත්මක සත්වයෙකු ලෙස උපත ලද මානව දරුවා සමාජ සත්වයෙකු බවට පත්කිරීම.**
**ඈ. ලොව විවිධ සමාජයන් අතර වෙනසක් හා අනන්‍යතාවයක් ගොඩනැංවීම.**
**ඉ. සමාජයක පුද්ගලයන්ගේ හැසිරීමට මගපෙන්වීම.**
**ඊ. එය සමාජයක පොදුවේ පිළිගනුලැබූ ජීවන ක්‍රමයක් වීම**

**සමාජ ස්ථරායනය (Social Stratification)**

සමාජයක් තුළ මිනිසුන් අතර නොයෙකුත් අසමානතාවයන් පවතී (දුප්පත්, පොහොසත්, තරුණ, මහලු, ගැහැණු - පිරිමි, ග්‍රාමීය, නාගරික ආදී වශයෙනි). එකී වෙනස්කම් සමාජයට ව්‍යුහගත වූ විට සහ එක් පරම්පරාවකින් තවත් පරම්පරාවකට ගමන් කළ විට ඇතිවන තත්ත්වය සමාජ ස්ථරායනය නම් වේ. පංතිය, කුලය, ජනවාර්ගිකත්වය, ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය ආදී අංශ හරහා ස්ථරායනය හඳුනාගත හැකිය. සමාජ ස්ථරායන සාධක පිළිබඳ සමාජ විද්‍යාත්මක විග්‍රහයන් විවිධ වේ. එමෙන්ම ස්ථරායනය කෘත්‍යාත්මක පදනමකින් ද, සමාජ අසමානතා වර්ධනය කරන්නක් ලෙස ද කරනු ලබන විග්‍රහ යටතේ ද්‍රෘශ්කෘත්‍යාත්මක පදනමකින් ද සමාජ විද්‍යාවේදී විග්‍රහ කෙරේ. ජීවන අවස්ථා සහ ජීවන රටාවන් යන ඒවා සමාජ ස්ථාරනයේ ප්‍රතිඵලයන් ලෙස සැලකේ.

- සමාජ ස්ථරායනය පිළිබඳ වෙබර්වාදී න්‍යාය
- පංතිය පිළිබඳ මාක්ස්වාදී විග්‍රහය
- සමාජ ස්ථරායනය පිළිබඳ සංඝටන න්‍යාය

සෑම සමාජයක් හා සමාජ සමූහයක් ගත් විටදීම ඔවුන් අතර විවිධ අසමානතා, වෙනස්කම් තිබෙන බව සරල නිරීක්ෂණයකදීම හඳුනාගත හැකිය. තත්ත්වය (Status) වනාහි යම් සමූහයක හෝ සමාජයක, සමාජීය වශයෙන්ම හඳුනාගත් යම් කිසි පිහිටීමක්. ඒ අනුව සමාජ විභේදනය (Social Differentiation) යනු සමාජ සමූහයක් තුළ පවතින එවැනි වූ විවිධ තත්ත්ව සම්මුතියකි. උදාහරණ ගත් විට දී ක්‍රීඩා සංවිධානයක් ගත් විට දී එහි ක්‍රීඩකයන්, අයිතිකරුවන්, කලමනාකරුවන්, ක්‍රීඩා රසිකයින්, ආධාරකරුවන්, අනුග්‍රහකයන්, ආදී විවිධ වූ තත්ත්ව සමූහ රාශියක් එම සංවිධානය තුළ පවතී. මොවුන් සමස්තයක් ලෙස ගත් විට සමාජ පද්ධතිය (Social System) නියෝජනය කළ ද වෙන් වෙන්ව ගත් විට දී ඔවුන්ට වෙන් වූ අභිලාෂ අරමුණු පවතී. විවිධ වූ තත්ත්වයන් ඒ තුළ ඔවුන් දරණ නිසාය. මේ අනුව සමාජ ස්ථරායනය යනු සංවිධානාත්මක ධූරාවලිගත වූ (Hierarchical) සමාජ තත්ත්වයක් වේ. ඒ ඒ සමාජ සමූහ විසින් සම්පත්, බලය, සමාජ තත්ත්වය, ළඟාකර ගැනීමේ හැකියාව සහ මට්ටම අනුව සමාජය තුළ ස්ථරායනය ද සාපේක්ෂ වශයෙන් ස්ථාවර, ධූරාවලි සමාජ සැකසුමක් බවට පත්වේ.

සමාජ ස්ථරායනය පිළිබඳව සාකච්ඡා කරන විට සමාජ අසමානත්වය (Social Inequality) පිළිබඳව විවිධ දාර්ශනිකයන් විසින් ඉදිරිපත් කළ අදහස් සළකා බැලිම වටී. මෙම අදහස ඇරිස්ටෝටල්, ප්ලේටෝ වැනි ග්‍රීක දාර්ශනික යුගයන් කරා ඈතට දිව යන අතර අවුරුදු දහස් ගණනක් මුළුල්ලේම සාකච්ඡාවට හා විමර්ශනයට ද බඳුන් ව ඇත. ලෝක ඉතිහාසය දෙස බැලූ විට දී සමාජ අසමානත්වය ගැටළුවක් හෝ ප්‍රශ්නයක් නොවූ සමාජ දැකිය හැක. නමුත් ක්‍රමිකව සමාජ සංවිධානය හා ව්‍යුහය තුළ සිදු වූ වෙනස්කම් මත මේ පිළිබඳ විශේෂ උනන්දුවක් යන විශේෂ අධ්‍යයනයක් සිදු කරන ලදී. විශේෂයෙන්ම 18 වන ශත වර්ෂ කාර්මික විප්ලවය වැනි සාධක මීට පසුබිම් සැපයීය. සමාජ ස්ථරායනය පිළිබඳව විවිධ සමාජ විද්‍යාඥයන් විවිධ නිර්වචනයන් සපයා තිබේ.

"මෙරිල්" නැමති සමාජ විද්‍යාඥයාට අනුව සමාජ ස්ථරායනය යනු,

"එකිනෙක මත යොදන ලද වරප්‍රසාද ප්‍රභේදයන්ගේ රටාවක් ලෙස" දැක්වේ.

"බර්නාඩ් බාබර්" දක්වන්නේ, සමාජ ස්ථරායනය යනු,

"සමාජ විභේදනයේත්, විවිධ සමාජ ඇගයීම් ක්‍රම වලත්, සමාජ අන්තර් ක්‍රියාවේත් නිෂ්පාදනයක්" ලෙසිනි.

ටැල්කොට් පාසන්ස් දක්වන්නේ "කිසියම් සමාජයක පුද්ගලයන් වර්ග කර අගයකිරීමේ මට්ටමක් සහ සාපේක්ෂ වශයෙන් සමාජය පිළිගත් අංශවලින් උසස් සහ පහත් ආකාරයෙන් සකස් කරගත් අනුපිළිවෙලක්" වශයෙනි.

ඇතැම් සමාජ විද්‍යාඥයන්ට අනුව සමාජ ස්ථරායනය යනු සමාජයේ පැවැත්මට අවශ්‍ය විවිධ තත්ත්වයන්ට සුදුසු පුද්ගලයන් සොයා ගැනීමට උපයෝගී කරගත් ක්‍රමයක් බව දැක්වේ.මෙසේ සමාජ ස්ථරායනය පිළිබඳ විවිධ අදහස් දක්වන බුද්ධිමය සියළුම විද්‍යාඥයන්ගේ අදහස් සලකන විට ස්ථරායනය වනාහි ස්වභාවික

සංසිද්ධියක් නොවන බව වටහා ගත හැක. එනම් මිනිසා විසින් සංස්ථාගත කරන ලද, ධුරාවලියක් ඔස්සේ සකස්කරනු ලැබුවක් බවට හඳුනාගත හැකග සමාජවාදී සමාජවල සමාජ අසමානතාව ඉතා අවම බව සාමාන්‍ය පිළිගැනීම වේ. එහෙත් පිරිසිදු සමාජවාදී රජයක් ලොව කොතැනකවත් නොමැත. සෝවියට් දේශය සමාජවාදී සමාජයේ සංකේතයක් ලෙස හඳුනාගනු ලැබුවද එහි ඉහළ ලෙස ධුරාවලිගත වරප්‍රසාද සහිත සීමිත පිරිසක් පැලක පන්තිය ලෙස පැවැත්මට ආ බව අධ්‍යයනවලින් හඳුනා ගත හැකිය.

## සමාජ ස්ථරායනයේ විවිධ රටාවන්

සමාජ ස්ථරායනය මූලික වශයෙන් වර්ග තුනක් ඔස්සේ හඳුනාගත හැකිය.

1. දේපල ක්‍රමය (Estate System)
2. කුල ක්‍රමය (Caste System)
3. පන්ති ක්‍රමය (Class System)

- **දේපල ක්‍රමය (Estate System)**

දේපල සඳහා ඇති හිමිකම හා ඒ මත ඒකාධිකාරීමය ලෙස බලය පැවරීම සඳහා ප්‍රභූන්ට ඇති හැකියාව මත නිර්වචනය වේ. ඉඩම් හිමි ප්‍රභූන්ට භූමියේ ඇති අයිතිය මතම සමාජයීය සම්පත් පාලනයට හා හැසිරීමට අසීමිත බලයක් ඇති වේ. සම්ප්‍රධායික වැඩවසම් ක්‍රමය මත සමාජය පංතිමය ලෙස බණ්ඩනය වීමක් සිදු විය.

1. උසස් වංශාධිපතිවරුන් (ඉඩම් හිමියන්)
2. පූජකයන්
3. මහජනයා ආදීන් (ප්‍රවේනි දාසයන්)

මහජනයා අතරට ගැමියන්, කුඩා පරිමාන වෙළඳුන්, විවිධ ශිල්පශ්‍රේණීන්, ගෘහ සේවකයන්, ආදී බහුතරයක් ජනයා එම ස්ථරයට අයත් ය. උසස් වංශාධිපතිවරුන්ට භූමිය අයත් වන අතර ඉඩම් අහිමි ජනයා හා ඔවුන්ගේ ශ්‍රමය පාලනයේ අයිතිය ද ඒ අනුව ඔවුනට හිමි වේ. දේපල ක්‍රමය කෘෂිකාර්මික සමාජවල සුලබව දක්නට හැකිය. පුද්ගලයාගේ "තත්ත්වය" ඉඩම් හිමිකම මත තීරණය වේ.

- **කුල ක්‍රමය (Caste System)**

පුද්ගලයාගේ උපතත් සමගම ඔහුට නියමිත සමාජ තත්ත්වය තීරණය වන්නේ කුල ක්‍රමය මතය. එය ආරෝපිත කුල ක්‍රමය (Ascribed Status) මත රඳා පවති. වෘත්තිමය තත්ත්වය අනුව ආර්ථිකයට දක්වන දායකත්වය මත එහි ඉහළ සිට පහළ තත්ත්වය තීරණය වේ. "ශුද්ධ" "පිරිසිදු" "උතුම්" යන අර්ථය සහිතව හින්දු කුල ක්‍රමය විකාශනය වේ.

- පංති ක්‍රමය (Class System)

මෙය කුල ක්‍රමයට වඩා විවෘත ස්ථර රටාවකි. උපතත් සමඟ තත්ත්වය තීරණය නොවන නිසාය.සමාජමය ලෙස එක් පන්තියක සිට තවත් පන්තියකට චලනතාවයට පුද්ගලයාට අවකාශ ඇත. ඒ අනුව කුලය තරම්ම ස්ථාවර හා අනම්‍ය ද නොවේ. එය සාධිත තත්ත්වයක් (Achieved Status) වේ. පුද්ගලයාටම ස්වකීය සමාජ පංතිය සාධනය කර ගත හැකි නිසාය. යම් පුද්ගලයකුට ලබා ගත හැකි අධ්‍යාපනික අවස්ථාඵ මූල්‍යමය හැකියාව, දේශපාලන හා සමාජීය බලසම්බන්ධතා මත පුද්ගලයා අයත්වන පංතිය තීරණය වේ. පුද්ගලයා භාවිතා කරන භාෂාව, අඳින පළඳින රටාව, ආචාර සමාචාර විධි, රුචීන්, ආදී සෑම අංගයකින් තමා අයත් වන පංතිය තීරණය වේ.ධනේෂ්වර සමාජ ක්‍රමයේ දී ධනපති හා නිර්ධන ලෙස පංති දෙකක් නිර්මාණය විය. නිර්ධන පංතියට තිබුනේ ශ්‍රමය පමණි.

<u>සමාජ ස්ථරායනය පිළිබඳ විවිධ න්‍යායන්</u>

ස්ථරායනය පිළිබඳ කෘත්‍යවාදී එළඹුම (Functionalist Approach) හා තාර්කික එළඹුම (Radial Approach) මෙහිදී ප්‍රධාන වේ. එසේත් නැතිනම් ගතානුගතික එළඹුම් හා ගැටුම්වාදී එළඹුම ලෙසිනි.

<u>සමාජ ස්ථරායනය පිළිබඳව ප්‍රධාන න්‍යායවාදීන් දෙදෙනෙකුගේ අදහස්.</u>

1. කාල් මාක්ස්
2. මැක්ස් වෙබර්

<u>කාල් මාක්ස්</u>

ඔහු දක්වන්නේ නිෂ්පාදන ක්‍රියාවලිය මත සමාජයේ මූලික ව්‍යුහය සකස් වේ. සමාජ පරිණාමය තුළ ඒඑ සමාජයට ආවේනික නිෂ්පාදන රටාවක් පවති. එකී නිෂ්පාදන රටාව තුළ නිෂ්පාදන සාධකවලට ඇති අයිතීන්ගේ ස්වභාවය අනුව පන්ති ක්‍රමය සකස් වේ.

| | අවධිය | පන්ති ක්‍රමය | |
|---|---|---|---|
| | | දේපල හිමි පන්තිය | දේපල අහිමි පන්තිය |
| 01 | ප්‍රාථමික (පංති රහිත) | - | - |
| 02 | වහල් | වහල් හිමියා | වහලා |
| 03 | වැඩවසම් | ඉඩම් හිමි රදළයා | ප්‍රවේනිදාසයා |
| 04 | ධනවාදී | ධනපති | කම්කරු |
| 05 | කොමියුනිස්ට් | - | - |

වහලුන් හා වහල් හිමියන් අතර වර්ධනය වන සමාජ ගැටුම් අවසානකයේ දී විප්ලවීය වෙනසකට ලක් වේ. එවිට වහල් ක්‍රමය බිඳ වැටී වැඩවසම් ක්‍රමය ඇතිවේ. එහිදී ප්‍රවේනිදාසයන් ඉඩම් හිමියන්ට එරෙහිව කරන

අරගලය නිසා ධනේශ්වර සමාජය ද කම්කරු ධනපති ගැටුම තුළින් අවසානයේ කොමියුනිස්ට් සමාජය ද බිහිවන බව මාක්ස් දක්වයි. නූතනයේ දී මාක්ස් න්‍යායේ ඇතැම් වලංගු නොවන අවස්ථා ඇති බවට විවිධ විවේචන ද එල්ල වී ඇත.

## .මැක්ස් වෙබර්

ඔහු මාක්ස්වාදය එක්තරා දුරකට පිළිගත් නමුදු, ඔහුගේ මතය වූයේ සමාජ උස් පහත්කම් ආර්ථික විෂමතාවට පමණක් සීමා නොවන බවයි. ඔහු සමාජ ස්ථරායනයේ අංශ 03 ක් දක්වයි.

1. පංතිය (Class)
2. සමාජ ගරුත්වය (Social Honor)
3. බලය (Power)

පංතිය යනු ජීවන අවස්ථා (Life Hence) වේ. එනම් සමාන ජීවන අවස්ථා ඇති අයගේ ඒකකයකි. ආර්ථිකමය සාධකය මෙහි දී වැදගත් වේ. සමාජ ගරුත්වය යනු පුද්ගලයෙකුට සමාජයෙන් ලැබෙන පිළිගැනීමේ මට්ටමයි. පිළිගැනීම වැඩිනම් ගරුත්වය වැඩිය. පිළිගැනීම අඩුනම් ගරුත්වය අඩුය. ගරුත්වය අතින් සමාන අය තත්ත්ව සමූහයක් (Status Group) ලෙස ඒකරාශි වේ.

පංතිය හඳුනා ගැනීමට ජීවන අවස්ථා වැදගත්වන්නාක් සේම ගරුත්වය හඳුනා ගැනීම ජීවන ශෛලිය (Style of Life) වැදගත් වේ. (කථා බහ, අචාර සමාචාර, ජීවත්වන නිවාස, ඇඳුම් පැළඳුම්)

බලය යනු සමාජයේ සෙසු අයගේ ජීවිත කෙරෙහි බලපාන තීරණ ගැනීමට කිසියම් පුද්ගලයෙක් සතු හැකියාව යි. "කෙනෙකුගේ අභිමතයට අනුව අන් අයගේ චර්යාව මෙහෙය වීමට ඇති හැකියාවයි."

මෙම මතයන් තුන එකිනෙකට ස්වාධීන බව වෙබර් දක්වයි. එනම් පංතියෙන් ඉහළ පුද්ගලයා ඇතැම්විට සමාජයෙන් එතරම් ගෞරවයක් නොලැබුණ ද (ව්‍යාපාරික) ඉහළ ගරුත්වයක් සහිත දුප්පත් පාසැල් ගුරුවරයා සමාජමය ලෙස පංතියෙන් ඉහළ අයෙකු නොවිය හැක. මෙකී සාධක සෑම විටම ඒකීයව ක්‍රියාත්මක නොවේ.

වෙබර්, මාක්ස්ට වඩා වෙනස් වන්නේ ආර්ථික සාධකය පමණක් නොව සමාජයේ පවතින මනෝමූල සාධක හරහා ද ස්ථරායනය පැහැදිලි කළ හෙයිනි.